පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ රු.5,000,000 කට මිලටගෙන තිබුණු අක්කර 01 යි පර්චස් 06 ක් වූ වීරඹුගෙදර "සෙන්ට් බ්‍රිජට් වත්ත" මූල්‍ය ප්‍රකාශනවලට රු.500,000 ක් ලෙස ගෙන තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

සභාවේ සේවය කර විශ්‍රාම ගන්නා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම මත සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ගෙවිය යුතු ශේෂය රු.8,140,747 ක්ව තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයකට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අතර රු .189,486 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.71,614,055 ක් විය. ඉන් රු. 12,064,235 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය.

02 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.32,195,720 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු. 48,748,055 ක් වීමෙන් මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.16,552,335 ක පිරිහීමක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.58,738,092 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.102,534,627 ක් වූ ප්‍රාග්ධන

වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.11,600,815 ක ඌනතාවයක් බවට පත්ව තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.116,866,479 න් දළ වශයෙන් 87% ක් ලෙස රු.101,558,090 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.58,738,092 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.84,670,758 න් දළ වශයෙන් 73% ක් ලෙස රු.61,417,807 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් දළ වශයෙන් 68% ක් ලෙස රු.41,730,489ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර එම වටිනාකම රජයේ පුනරාවර්තන දායකය යටතේ ගිණුම්ගත කර තිබුණි. ප්‍රාග්ධන වියදම වූ රු.102,534,627 න් දළ වශයෙන් 6% ක් ලෙස රු.5,847,426 ක් පමණක් සභා අරමුදලින් වැය කර තිබූ අතර දළ වශයෙන් ඉතිරි 94% ක් වූ රු.96,687,201 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ඉටුකල සංවර්ධන කාර්යයන් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 වරිපනම් බදු

(අ) සමාලෝචිත වර්ෂයේ හිඟ වරිපනම් බදු ලෙස ගිණුම් තුල දක්වා තිබුණු රු.6,198,153 න් රු.1,776,106 ක් ලෙස දළ වශයෙන් 29% ක් පොතුහැර උප කාර්යාලයට අදාලවද, රු.2,094,210 ක් ලෙස දළ වශයෙන් 34% ක් හතලිස්පහුව උප කාර්යාලයටද අදාලව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත සමුච්චිත වරිපනම් බදු හිඟය වූ රු.6,198,153 ක් තුල පසුගිය වර්ෂවලට අදාලව රු.4,442,481 ක් ලෙස දළ වශයෙන් 72% ක් පැවතුණි.

2.3.2 කඩ කුලී

(අ) පොදු වෙළඳපල කඩ කාමරවලට අදාලව දීර්ඝ කාලයක සිට පැවත එන රු.45,712 ක හිඟ ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පැවතුණි.

(ආ) 2011 වර්ෂයේ කඩා ඉවත් කල පොදු වෙළඳපල කඩ කාමර 06 කට අදාලව රු.30,643 ක් ද, පොල්ගහවෙල නගරයේ වෙළඳ කුටි 03 කට අදාලව රු.54,770 ක්ද වශයෙන් වූ රු.85,413 ක් සමාලෝචිත වර්ෂය දක්වා හිඟව පැවතුණි.

(ඇ) වර්තමානයේ බිල් කිරීම් සිදු නොවන ස්ථාන තුනකට අදාලව රු.10,511 ක හිඟ කුලියක් සමාලෝචිත වර්ෂය දක්වාම පැවතුණි.

2.3.3 බදු කුලී

(අ) හිඟ ආදායම් රු.2,115,756 ක් අයකර ගැනිම සඳහා පවරා තිබූ නඩු 7 කට අදාළව ලේඛණ හා වාර්තා නිසි පරිදි පවත්වා නොගැනීමෙන් නඩු තීන්දු විස්තර හා වර්තමාන තත්ත්වය හඳුනාගත නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයවන විට බස් නැවතුම්පල ආපන ශාලාව බදු දීම වෙනුවෙන් අදාල බදුකරුගෙන් රු.684,158 ක් හිඟව පැවතුණි.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයත් වීරඹුගෙදර උප කාර්යාලය පිහිටි අක්කර 3 ක ඉඩම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් පවරා නොගැනීම හේතුවෙන් කොමිෂන් සභාව එකී ඉඩම පෞද්ගලික පාර්ශවයකට ලබා දී තිබුණි. සභාව නැවත එකී ඉඩමෙන් අක්කර 01 පර්චස් 06 ක කොටසක් ලබා ගැනීම සඳහා සභා අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී රු.5,000,000 ක් වැය කර තිබුණි.

(ආ) සභාවට අයත් ඔරලියද්ද ඉඩමෙහි අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට නීතිමය කටයුතු කර නොතිබූ අතර එම ඉඩමෙහි ප්‍රමාණය හා වටිනාකම ඉඩම් උපලේඛණය තුලට ගෙන ද නොතිබුණි.

3.2 <u>නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්</u>

සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත රු.1,255,000 ක් වටිනා අංක 68-3676 දරන ටිපර් රථය හා රු.1,319,050 ක් වටිනා අංක LF-4884 දරන බෙල්රෝ ජීප් රථය පිළිවෙලින් 2013 හා 2014 වර්ෂයේ සිට නිශ්ක්‍රියව පැවතුණි.

04 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) වාහන පාලනය